විශ්ව නාට්‍ය කලාවේ ආභාෂය ලද හාර පංගු මෙල්බර්න් ශ්‍රී ලාංකික නාට්‍ය කැළ (Sri Lankan Theatre Group Melbourne) නිර්මාතෘ යශෝධරා සරච්චන්ද්‍ර සහ කුසුම්සිරි ලියනආරච්චි යුවල මෙල්බර්න් නුවර වෙසෙන ශ්‍රී ලාංකීය රසික රසිකාවියන්ට අලුතෙන් හඳුන්වා දීමට අවශ්‍යතාවක් නැහැ. එම යුවල මේ වන විට ශ්‍රී ලාංකීය රංග කලාවට දායාද කර තිබෙන නිර්මාණ මෙල්බර්න් නුවර පමණක් නොව සිඩ්නි, ඇඩිලේඩ් සහ පර්ත් හිදීද, ශ්‍රී ලංකාවේ විවිධ පළාත් වලද, නවසීලන්තයේ වෙලින්ග්ටන් සහ ඕක්ලන්ඩ් නුවරද කීප වරක්ම වේදිකාගත කර තිබෙනවා.

මෙල්බර්න් ශ්‍රී ලාංකික නාට්‍ය කැළ යටතෙහි කුසුම්සිරි සහ යශෝධරා මෙහෙයවන, වර්ෂ 2007 මාර්තු 02 වෙනිදා ආරම්භ කෙරුණු, නාට්‍ය පුහුණු පාසලට සහභාගී වන දූ පුතුන්ගේත්, වැඩිහිටියන්ගේත් දායකත්වයෙන් මේ වන විට වේදිකාවට එකතුවී ඇති නිර්මාණ සංඛ්‍යව දහයකට ආසන්නයි. ඒවා අතර දඟයා, මුත්තගේ විත්ති, පුංචි අන්දරේ, දේව වස්ත්‍රය, රත්තරන්, එලොව ගිහින් මෙලොව ආවා, Happine෴, පුංචි පැන්චෝ I, පුංචි පැන්චෝ II සහ ගමරාළයි සුදු අලියයි ප්‍රමුඛ තැනක් ගන්නවා.

යශෝධරා සහ කුසුම්සිරි ගේ නාට්‍ය පුහුණු පාසල ආරම්භ කෙරුනේ මෙල්බන් නුවර ජීවත්වන පාසල් යන වියේ පසුවන ශ්‍රී ලාංකීය දූ පුතුන් උදෙසායි. එසේ නමුත් මේ වන විට වයස අවුරුදු හතරක් පමණ වන සිඟිත්තන්ගේ සිට මැදි විය ඉක්මවූ වැඩිහිටියන් දක්වාවූ සිය දෙනෙකුට අධික පිරිසක් වික්ටෝරියා ප්‍රාන්තයේ ගිනිකොණ සහ උතුරු ප්රෙදේශවල පැවැත්වෙන එම නාට්‍ය පාසල ට සහභාගී වෙනවා. එයින් පිළිබිඹු වන කාරණය නම් මේ නාට්‍ය පාසලට සහභාගී වීමෙන් ලැබෙන වින්දනය කිසිම වයස් කාණ්ඩයකට සීමා වී නැති බවයි.

යශෝධරා සහ කුසුම්සිරි යුවල ගේ නාට්‍ය පාසල ආරම්භ කිරීමේ අමුලික අරමුණ වුයේ අපගේ මව් බිමවූ ශ්‍රී ලංකාවෙන් ඈත්වී ජීවත්වන දූ දරුවන්ට, අපගේ සංස්කෘතික දායාද සහ සාර ධර්ම වලින් බිඳක් තිලිණ කිරීමයි. ඔවුන්ගේ එම මුලික අරමුණ මල් ඵල ගැන්වී ඇති බව මෙම නාට්‍යය පාසල ට සහභාගීවන දූ දරුවන්ගේ හැසිරීමෙන් මනාව පිළිබිඹු වෙනවා. මෙල්බන් නුවර වැනි වේගවත්, කාර්ය බහුල සහ තරගකාරී සමාජයක් තුල ජීවත් වුනත් එම දූ පුතුන්ගේ හැසිරීම ඉතා ආදර්ශමත්. තවමත් අපගේ සාරධර්ම අගය කිරීම, සාමුහිකත්වයෙන් වැඩ කිරීම, එකිනෙකාට උපරිමයෙන් සහයෝගය දැක්වීම, අනිකුත් අයගේ දක්ෂතා අගය කිරීම, සුදුස්සාට සුදුසු තැන ලබාදීම, තමන්ගේ හැකියාවේ තරමට කණ්ඩායමක් ලෙස පොදු අරමුණක් කරා යාමට උපරිමයෙන් උත්සාහ ගැනීම වැඩිහිටියන්වන අපටත් ආදර්ශයක් වෙනවා.

**හාර පංගු වල විශේෂත්වය වන්නේ, මෙම නාට්‍ය හතරම ලෝකයේ එකිනෙකට වෙනස් සංස්කෘතීන් හතරකින් බිහිවූ නිර්මාණ හතරක පරිවර්තන වීමයි. එමෙන්ම ඒවා ශ්‍රී ලාංකීය සම්ප්‍රදායට ගැලපෙන පරිදි අනුවර්තනය කර ගැනීමට ඒවා අධ්‍යක්ෂණයේදී කර තිබෙන වෙනස්කම්ද අගය කල යුතු වෙනවා.**

යශෝධරා සහ කුසුම්සිරි දෙපල ගේ ආරම්භක නිර්මාණ ශ්‍රී ලාංකීය සම්ප්‍රදායායනුකූලව, අපට හුරු පුරුදු සිහල බසින් ඉදිරිපත් කෙරුණා. එසේ නමුත් අපගේ දූ දරුවන්ගේ දක්ෂතා වඩා පුළුල් ප්‍රේක්ෂක පිරිසක් අතරට ගෙනයාමට එය තරමක බාධකයක් වුණා. මෙය මගහරවා ගැනීමේ අරමුණින් නව ආරක නිර්මාණයක් මුලින්ම වේදිකාවට ඉදිරිපත් කෙරුනේ 2013 වර්ෂයේදීයි. 'Happiness' නම් වූ එම නිර්මාණයේ තිබූ තවත් සුවිශේෂ කාරණය නම්, එය අධ්‍යක්ෂණය කරනු ලැබුවේ එවකට වී.සී.ඊ. විභාගයට සුදානම් වෙමින් සිටි, ආරම්භයේ පටන් නාට්‍ය පන්ති වලට සහභාගීවූ හසිනි ඉලංගරත්න දියණිය විසින් වීමයි. එහි සාර්ථකත්වය සඳහා අනෙකුත් සියලූම දූ පුතුන්ගේ දායකත්වයත්, දෙමාපියන්ගෙන් නොමදව ලැබුණු සහයෝගයත්, යශෝධරා සහ කුසුම්සිරි දෙපලගේ මනා අධීක්ෂණයත් හේතුවූ බව සඳහන් කල යුතුම වෙනවා.




මෙවර මෙල්බර්න් ශ්‍රී ලාංකික නාට්‍යවය කැළ තවත් පියවරක් ඉදිරියට තබමින්, විශ්ව රංග පීඨයේ (World Theatre) ආභාෂය ලබා "හාර පංගු" (Four) නමින් කෙටි නාට්‍ය හතරකින් සමන්විතවූ නව නිර්මාණයක් 2015 අගෝස්තු මස 22 වෙනිදා එලි දැක්වීමට ලහි ලහියේ සූදානම් වෙනවා. ඒ පිළිබඳව කුසුම්සිරි ලියනආරච්චි මහතා අදහස් දක්වමින් මෙසේ කියනවා.



"මීට පෙර නාට්‍ය පුහුණු පාසල මුල් කොටගෙන කල නිර්මාණ කාර්යයන් හිදී අපේ ප්‍රයත්නයන් අතර මුල් වුනේ ශ්‍රී ලංකික අනන්‍යතාවකින් හෙබි රංග ශෛලීන්ගේ, නාට්‍ය සම්ප්‍රදායන්ගේ ඇසුරක් සහ අවබෝධයක් ළමා, තරුණ පිරිසට අත්පත්කොට දීමට. නමුත් මේ වන විට අවුරුදු අටක පමණ කාලයක් තිස්සේ නාට්‍ය පාසල ට සම්බන්ධවී වැඩ කරන දරුවන්ට විශ්ව රංග කලා ශෛලිය හඳුන්වා දීමටත්, ඒ පිළිබඳව යම් තරමකින් හෝ අත්දැකීමක් ලබා දීමටත් කාලය සුදුසු බව අපගේ හැඟීමයි. අපගේ සංස්කෘතියේ ගුණාංග තව තවත් අගැයීමකට ලක්කෙරෙන චින්තනයක් බිහිකිරීමට මෙම ප්‍රයත්නය ඉවහල් වේයැයි අප සිතනවා"

හාර පංගු වල විශේෂත්වය වන්නේ, මෙම නාට්‍ය හතරම ලෝකයේ එකිනෙකට වෙනස් සංස්කෘතීන් හතරකින් බිහිවූ නිර්මාණ හතරක පරිවර්තන වීමයි. එමෙන්ම ඒවා ශ්‍රී ලාංකීය සම්ප්‍රදායට ගැලපෙන පරිදි අනුවර්තනය කර ගැනීමට ඒවා අධ්‍යක්ෂණයේදී කර තිබෙන වෙනස්කම්ද අගය කල යුතු වෙනවා. මේ පිළිබඳව වැඩිදුර තොරතුරු දැනගැනීමට එම නිර්මාණ සඳහා දායක වුනු දියණියන්ගෙන්ම විමසා බලමු.

## මගුල් පරස්තාව

"මගුල් පරස්තාව" නාට්‍යය අධ්‍යක්ෂණය කරන වසුන්දරා ඕපනායක දියණිය ඇයගේ නිර්මාණය පිලිබඳ අදහස් දක්වමින් මෙසේ පැවසුවා.

"මම මීට අවුරුදු අටකට පෙර මුලින්ම මෙම නාට්‍ය පන්තියට ඇතුල් වුනේ වැඩිපුරම දෙමාපියන්ගේ උවමනාවට. ඒකට හේතුව, මට ඕන වුනේ ඉංග්‍රීසි නාට්‍ය පාසලකට සම්බන්ධ වෙන්නයි. පන්තියේ පළමු දවස මට කවදාවත් අමතක නොවෙන්නේ අපට අපේම අනන්‍යතාව තියාගෙන යමක් කරන්න එදා ලැබුණු නිදහස නිසයි

රුසියානු ජාතික ඇන්ටන් චෙකෝව් විසින් ලියන ලද 'The Marriage Proposal'" යු. ඊ. ගුණරත්න විසින් "මගුල් පරස්තාව" නමින් සිංහලට අනුවර්තනය කරනු ලැබුවා. මෙය චරිත මත පදනම්වුණු (Character based) තාත්වික නාට්‍ය සම්ප්‍රදායට අයිති එකක්. මම එහි ඉංග්‍රීසි පිටපත මුලින්ම කියවපු වෙලාවේ එහි තිබුන චරිත වලට අමතරව තවත් චරිතයක් එකතුවුනා නම් හොඳයි කියා සිතුනා. එම චරිතය උපයෝගී කරගෙන මගේ පෞද්ගලික චරිත ස්වභාවය මෙම නාට්‍යයට ඇතුළත් කිරීමෙන් එහි හාස්‍ය රසය වැඩි කිරීමට හැකිවුණා. ඇන්ටෝන් චෙකෝව් ඔහුගේ නාට්‍ය වල යොදාගත් චරිත හරහා ප්‍රේක්ෂකයන් වෙත ලබාදුන් හාස්‍ය රසය ඒ ආකාරයෙන්ම, නමුත් ශ්‍රී ලාංකීය ආරකට මෙම නාට්‍යයෙන් ඉදිරිපත් කෙරෙනවා"
.
"එමෙන්ම මගේ නාට්යයයේ රඟපාන සොයුරු සොයුරියන් ගැන මෙහිදී සඳහන් කල යුතුම වෙනවා. ඔවුන්ගේ හැකියාවන් ඉතා ඉහළයි. ඔවුන්ගේ හැකියාවන් ගැන මට තිබුණු දැනීම නිසා චරිත තෝරාගැනීම් කරන විට මට හරි පහසුවක් වුණා. මම ඔවුන්ගේ ස්වභාවික රංගන ශෛලය යොදා ගැනීමට ඔවුන්ට නිදහස දීමෙන්, ඒ ඒ චරිත වලට අනන්‍ය වූ තාත්වික රංගනයක් ලබා ගැනීමටත් හැකිවුණා"

වසුන්දරා දියණිය දැනට මොනෑෂ් විශ්ව විද්‍යාලයේ අවසාන වසරේ ව්‍යාපාර නීතිය පිලිබඳ පාඨමාලාව හදාරනවා. මුල පටන්ම නාට්‍ය කලාව සහ රංගනය පිලිබඳව ඇගේ තිබුණු උනන්දුව ඒ අයුරින්ම අදත් දකින්නට ලැබීම විශේෂ දෙයක් ලෙස කියන්න පුළුවන්.

## අලි පැංචා

හසිනි ඉලංගරත්න දියණිය ඇයගේ අත්දැකීම් මෙසේ ඉදිරිපත් කරනවා.

"මෙම නාට්‍ය පන්තියට සහභාගී වීමට ආරම්භයෙදී මගේ එතරම් රුචියක් තිබුනේ නැහැ. නමුත් අද වන විට මට කියන්න පුළුවන් එයට සහභාගී වීමට ලැබීම මගේ ජීවිතයේදී ලද විශාල වරප්‍රසාදයක් කියලා. "The Elephant Calf (අලි පැංචා) යන නාට්‍ය ලියා ඇත්තේ, ජර්මානු ජාතික ප්‍රසිද්ධ නාට්‍ය රචකයෙකු වන බර්ටෝල්ට් බ්රේෂ්ට් විසින්. මම මීට පෙර අධ්‍යක්ෂණය කල, ~Happiness The Play~ සඳහාත් බ්රේෂ්ට් ගේ ~Epic Theatre' සම්ප්‍රදාය භාවිතා කලා. පාසලේදී බ්රෙෂ්ට්ගේ නාට්‍ය සම්ප්‍රයදාය පිළබඳ යම්තමින් හැදෑරුවත් ඒ ගැන තවදුරටත් අධ්‍යයනය කිරීමට ඇතිවූ උනන්දුව නිසා මේ නාට්‍ය තෝරාගත්තා.

පළමු සහ දෙවන ලෝක යුද්ධ දෙකෙන්ම අත්දැකීම් ලැබූ බ්රෙෂ්ට්ගේ බොහෝ නාට්‍ය රචනා පදනම්වී ඇත්තේ එම කාලයේ පැවතුනු විවිධ දේශපාලන මතිමතාන්තරත්, දේශපාලන ගැටුමුත් පදනම් කරගෙනයි "අලි පැංචා" නිර්මාණය වී ඇත්තේ සමාජය විසින් අපරාධකරුවකු ලෙස හංවඩු ගසනු ලැබූ අවිහිංසක පුද්ගලයෙකුගේ චරිතයක් මුල් කර ගෙනයි. බ්රෙෂ්ට්ගේ නිර්මාණ වල ඇති තවත් ලක්ෂණයක් වන, හාස්යම රසය මගින් නාට්යේයයෙන් දීමට බලාපොරොත්තු වන සත්යමමය පණිවිඩය වසන් කර තැබීම මෙහිදීත් දකින්න පුළුවන්.

"කණ්ඩායමක් ලෙස රඟපෑමේ කටයුතු වල යෙදෙන විට ආත්මාර්ථකාමීත්වය, ස්වයං අභිමානය වැනි හැඟීම් අපතුළ ඇතිවෙන්නේ නෑ. එකිනෙකා අතර ඇති බැඳීමත්, එකිනෙකාගේ ශක්තියත් උදව් කරගෙන සාර්ථක නිර්මාණයක් ප්‍රේක්ෂකයන්ට ඉදිරිපත් කිරීමටයි අප හැම විටම උත්සාහ දරන්නේ. බෞද්ධ ධර්මයට අනුව, අප අතර ඇති මේ බැඳීම සංසාරගත එකක් ලෙස මට හැඟෙනවා. එදා පටන් මේ දක්වා අපට මග පෙන්වමින් නාට්‍ය කලාව යනු කුමක්දැයි අපට වටහා දුන් ආදරය කුසුම්සිරි මාමා සහ යශෝදරා නැන්දාට අපගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා.

හසිනි දියණිය මේ වන විට මොනෑෂ් විශ්ව විද්‍යාලයේ ඖෂධ වේදී පීඨයේ තුන්වැනි වසරේ ඉගෙනුම ලබනවා. ඇය නාට්‍ය කලාවට පමණක් නෙමෙයි ගීත ගායනයට සහ උඩරට නැටුමටත් අති දක්ෂයි.

## මරණ පරීක්ෂණය

"මරණ පරීක්ෂණය" යන නාට්‍ය අධ්‍යක්ෂණය කරන රන්දුලා වල්පොල දියණිය ඇගේ අදහස් ඉදිරිපත්කළේ මේ ආකාරයටයි.

"මෙම නාට්‍යයට පදනම් කරගත්තේ ඉතාලියානු ජාතික මාර්කෝ ලූලිගේ 'Dr' Arlecchino" or the Imaginary Autopsy ~ යන නිර්මාණයයි. මෙය Commedia Dell යන සම්ප්‍රදායට අයත් නාට්‍යයක්. මගේ වැඩි කැමැත්ත තිබුනේ අරුත් බර නිර්මාණ සඳහා දායකත්වයක් දීමටයි. නමුත් එයින් ඔබ්බට ගොස්, අවසානයේදී හාස්‍ය රසය පමණක්ම ලබාදෙන නිර්මාණයක් කිරීමට අදහස් කළේ අපේ එදිනෙදා ජීවිතයේ සමතුලිතබව රැකගන්න හාස්‍ය රසයත් අත්‍යවශ්‍ය දෙයක් වන නිසයි. මට මුලින්ම තිබුන අභියෝගය වුනේ, එය ඉංග්‍රීසි බසින් සිංහල බසට පරිවර්තනය කිරීමයි. ඊට පසු එය අපේ සංස්කෘතියට ගැලපෙන ආකාරයට වෙනස්කම් කීපයක් කරන්න සිදුවුණා. මෙම ශෛලියේ නාට්‍ය නිර්මාණයවූ අවධියේ ගැහැණු සහ පිරිමි චරිත සියල්ලම රඟපානු ලැබුවේ පිරිමින් විසිනුයි. මම එහි වෙනසක් කරමින් සමහර ගැහැණු චරිත සඳහා පිරිමින් යොදාගත්තා. එයින් නාට්යරයයේ ඇති හාස්‍ය රසය තවත් වැඩිවේයැයි

44 වන පිටට